# බට්ටීගේ අලුත් යහළුවා



මද්‍යසාර සහ
මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයේ
**ප්‍රකාශනයක්**

ADIC
Alcohol and Drug Information Centre

# දරුවන් සැමට
# එක ලෙස සෙනෙහස පුදන්නට හැකි  වු
# පෙර පාසල් ගුරු මෑණිවරුන් උදෙසා

දරුවන් කුඩා කල සිට මද්‍යසාර, දුම්වැටි වලට හුරු කිරීම උදෙසා ක්‍රියා කරන එම සමාගම් වල උපක්‍රම වලට දරුවන් තුල ප්‍රතිශක්තිකරණය ඇති කිරීමේ අරමුණෙන්, පෙර පාසල් ගුරුවරුන්ට මෙම කතාන්තර දරුවන්ට කියා දිය හැකි ආකාරයට මෙම පොත නිර්මාණය කර ඇත.

පරිසරයත් සමඟ මුසුවෙමින් ජීවත්වන බට්ටි නම් දැරිය සහ හා පැංචාගේ චරිත තුළින් ගොඩ නැංවී ඇති මෙම කතාව හරහා විශේෂ පණිවිඩයක් ලබාදීමට උත්සාහ කර ඇත.

සිගරට් බිව්වාම මූණ කැතවෙනවා තොල් කැතවෙනවා යන සැබෑ තත්වයන් ඉගෙන ගැනීමත් එසේම කෙනෙකුගේ මුහුණ දැකීම තුළින් ඔහුගේ මුහුණේ වෙනස හඳුනා ගැනීමට දියණියකට වුද හැකියාව ඇති කළයුතු බවමෙහිදී පෙන්වා දීමට උත්සාහ කර තිබේ.

දරුවන්ට කුඩා කල සිට මුහුණ දෙස බැලීමෙන් සිගරට් බොන පුද්ගලයන් හදුනා ගැනීමට හැකි වීම ප්‍රතිශක්තීකරණය ඇති වෙමින් දරුවන් වැඩෙන බවට සනාථ කළ හැකි කරුණකි.

---

ඔබගේ අදහස් අපට වැදගත්

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org

**චිත්‍ර නිර්මාණය** -
තේජා දෙහිවත්ත


**පිටු සැකසුම** -
හර්ෂණ නිමලසූරිය

**සංකල්පය** -
මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)

බටිති එයාගෙ අම්මයි, තාත්තයි එක්ක ලස්සන පුංචි ගෙදරක ජීවත් වුණා.

බටිති එයාගෙ අම්මටයි, තාත්තටයි හරිම ආදරෙයි.

බටිතිගේ තාත්තාට ලස්සන එළවළු කොටුවක් තිබුණා.




එයාට සෙල්ලම් කරන්න කවුරුවත් නැති නිසා බටිති ඉන්නෙ හරිම පාලුවෙන්.

දවසක් බටිති තාත්තාගෙ එළවළු කොටුවෙ හාපැංචෙක් ඉන්නවා දැක්කා.



බට්ටි හෙමින් හෙමින්
හාපැංචා ළඟට කිට්ටු වුණා.

"හාපැංචා ඔයා මගෙත් එක්ක
සෙල්ලම් කරන්න එනවද" බට්ටි හා
පැංචාගෙන් ඇහුවා.



හාපැංචා කිසිම සද්දයක් නැතුව හිටියා.

බට්ටි හාපැංචා ළඟට තවත් කිට්ටු වුණා.

ළඟට කිට්ටු වෙන බට්ටි දිහා හාපැංචා බලාගෙන හිටියා.

"ඔයා මගේ හොදම යාහළුවා වෙනව ද?" බට්ටි හාපැංචාගෙන් ඇහුවා.

"මම කැමතියි එන්න අපි සෙල්ලම් කරමු" හාපැංචා කිව්වා.

තාත්තාගේ එළවළු කොටුවෙ දෙන්නාම සතුටින් සෙල්ලම් කළා.



යාහළුවෝ දෙන්නා සෙල්ලම් කරන
එළවළු කොටුව ළඟින් මාමා
කෙනෙක් ඇවිදන් ගියා.



“බලන්න අර මාමාගේ මූණ
කැතවෙලා තොල් දෙක කැතවෙලා”

බට්ටි හාපැංචාට පෙන්නුවා.

“අනෙක් මාමලාට වඩා ඒ මාමා
කැතවෙලා තියෙන්නෙ ඇයි ?”

හාපැංචා බට්ටිගෙන් ඇහුවා.



"**සිගරට් බොන මාමලාගේ තොල් කැත වෙනවා, මූණ කැත වෙනවා, ලස්සන නැති වෙනවා කට ගඳ ගහනවා** කියලා අපේ ටීච කියලා දුන්නා"

බට්ති හාපැංචාට කිව්වා.

"අනේ එහෙනම් ඒ මාමා සිගරට් බොනවා ඇති පව් ඒ මාමා"

හාපැංචා හරිම දුකෙන් කිව්වා.



සිගරට් බිව්වම මූණ කැතවෙලා
ලස්සන නැති වෙනවා කියලා
මම හැමෝටම කියලා දෙනවා

එතකොට එයාලා සිගරට් බොන්නෙ
නැතිවෙයි එතකොට එයාලගෙ
මුණ ලස්සන වෙයි නෙ  හාපැංචා
හිතුවා.



# අපේ තාත්තා
## අරක්කු බොන්නේ නැත්තේ
## මට ආදරේ හින්දයි



එයාටත්
# සතුටින් ඉන්න
# ඕන නිසයි

ADIC
Alcohol and Drug Information Centre

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC)
40/18, උද්‍යාන පාර, කොළඹ 05.
දුක: 011 2584416, ෆැක්ස්: +94 112508484
http://adicsrilanka.org